# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 ජූලි


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 ජූලි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 2.5%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 ජූනි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2.4%ක් ලෙස වාර්තා විය. 2024 ජූලි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.3% ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.2%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 ජූනි මාසයේදී 1.9% සිට 2024 ජූලි මාසයේ 2.9% දක්වා වැඩි වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 ජූනි මාසයේදී 2.7% සිට 2024 ජූලි මාසයේදී 2.2% දක්වා අඩු වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම:2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කළ විට, 2024 ජූනි මාසයේ 208.1ක් වූ දර්ශකාංකය, 2024 ජූලි මාසයේ දී 206.9 ක් දක්වා අඩු වී ඇති බව වාර්තා විය. මෙමගින් 2024 ජූනි මාසයට සාපේක්ෂව 2024 ජූලි මාසයේ දර්ශකාංකය 1.2ක අඩුවීමක් එනම් 0.57 ක ප්‍රතිශතාංක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 0.22% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.79% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූ විට මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, අර්තාපල්, සහල්,පොල් තෙල්, අලුත් පළතුරු, අමුමිරිස්, කහ කුඩු, රතු ළූණු, කරවල, බිත්තර සහ තේ කුඩු/කොළ යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත්, දෙහි, අලුත් මාළු, කුකුළු මස්, ලොකු ළූණු, පොල්, සීනි, පාන් (සාමාන්‍ය), කිරිපිටි, මුං ඇට, මිරිස් කුඩු, නූඩ්ල්ස් සහ ඉගුරු යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2024 ජූලි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන'(*විදුලි බිල සහ එල්.පී ගෑස්*), 'ප්‍රවාහන'(*පෙට්‍රල් සහ බස් ගාස්තු*), 'විනෝදාත්මක සහ සංස්කෘතික'(*අභ්‍යාස පොත් හා ලිපි ද්‍රව්‍ය*), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත්, 'සෞඛ්‍ය'(*පුද්ගලික වෛද්‍ය ගාස්තු*), 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය'(*පුවක්*), 'විවිධ භාණ්ඩ සහ සේවා'යන අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද, 'ආපන ශාලා සහ හෝටල්'යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු අඩුවීමක් වාර්තා වී ඇත. එහෙත්, 'රෙදිපිළි සහ පාවහන්', 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. තවදුරටත් සළකා බැලීමේදී, 'සංනිවේදන' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිල ජූලි මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 ජූනි මාසයේ 3.9% සිට 2024 ජූලි මාසයේදී 3.0% දක්වා අඩුවීමක් වාර්තා විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2023 | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |
| | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |
| | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |
| | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| 2024 | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |
| | අප්‍රේල් | 208.2 | 231.1 | 193.4 | 193.9 | -0.9 | -0.3 | 2.7 | 3.3 | 2.3 | 3.0 |
| | මැයි | 206.3 | 227.3 | 192.8 | 193.6 | -0.9 | -0.2 | 1.6 | 0.5 | 2.4 | 3.1 |
| | ජූනි | 208.1 | 232.8 | 192.1 | 193.7 | 0.9 | 0.1 | 2.4 | 1.9 | 2.7 | 3.9 |
| | ජූලි | 206.9 | 234.0 | 189.4 | 193.7 | -0.6 | 0.0 | 2.5 | 2.9 | 2.2 | 3.0 |